# ශ්‍රී ලංකාවේ දුප්පතුන් - තවදුරටත් දුප්පතුන් වීමට පෙර......
# දිළිඳුකම හා ගෝලීයකරණය පිළිබඳ විමසුමක්

දරිද්‍රතාව, දිළිඳුකම, දුප්පත්කම එදිනෙදා සාකච්ඡාවන්වල දී මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී ද නිරන්තරවම භාවිතා වන වදනකි. දිළිඳුකම යන්න ආර්ථික, සංස්කෘතික, දේශපාලන මෙන් ම අධ්‍යාත්මික ආදී සෑම ක්ෂේත්‍රයක් තුළම ඇතිවිය හැකි, පැවතිය හැකි දෙයකි. එසේ වුවත්, එදිනෙදා සාකච්ඡාවන්හි දී බොහෝ විට අවධාරණය කරනු ලබන්නේ ආර්ථික දිළිඳුකම බව පෙනේ. මෙම වචනයෙන් කිසියම් හිඟයක්, නොහැකියාවක්, අඩුවක් පිළිබඳව අදහස් වේ. දිළිඳුකම යන්න කිහිප ආකාරයකින් විග්‍රහ කළ හැකිය. එනම්, සාපේක්ෂ දිළිඳුකම, නිරපේක්ෂ දිළිඳුකම, නිධන්ගත දිළිඳුකම ආදී වශයෙනි.

සෑම සමාජයකම ආර්ථික මට්ටමින් ඉහළ, මධ්‍යම සහ පහළ ස්ථරයන්හි පිරිස් වෙසෙති. එම එකිනෙක කොටස් එකිනෙකාට සාපේක්ෂ වශයෙන් ආර්ථික මට්ටමින් දිළිඳු හෝ පොහොසත් වේ. මේ අනුව, සෑම සමාජයකම සාපේක්ෂ දිළිඳුකමක් පවතින අතර එය ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙන්ම සමාජයෙන් සමාජයට ද වෙනස් වේ. ඇතැම් සමාජයක පවතින සාපේක්ෂ දිළිඳුකම, තවත් සමාජයක සාපේක්ෂ දිළිඳුකම සමග සැසඳීමේදී ඉතාම පහළ මට්ටමේ පවතින්නක් විය හැකිය. නැතහොත් දිළිඳුකමේ ලක්ෂණයක් නොවීමට ද ඉඩ ඇත.

මිනිසාට ජීවත්වීමට අවශ්‍ය පෝෂණ තත්ත්වය, කැලරි ප්‍රමාණය ආදී සාධක මත නිරපේක්ෂ දිළිඳුකම තීරණය වේ. නිරපේක්ෂ දිළිඳුකම ද මුදල් ඒකක මත පදනම් වී වර්තමානයේ ගණනය කරනු ලබයි. මේ සම්බන්ධව වැදගත් නිර්ණායකයක් ලෙස ලෝක බැංකුවේ නිර්ණායකය සැලකිය හැකිය. එයට අනුව, පුද්ගලයෙකුගේ වාර්ෂික ආදායම ඇමරිකානු ඩොලර් 360 වඩා අඩුනම් ඔහු දුප්පතෙකු ලෙස සැලකේ. එමෙන්ම, දිනකට ඇමරිකානු ඩොලර් 0.75 ට වඩා අඩුවෙන් ලබන පුද්ගලයන් අන්ත දිළින්දන් ලෙසින් සලකනු ලබයි. නිරපේක්ෂ දිළිඳුකමේ දී එය ගණනය කිරීම සඳහා යොදා ගැනෙන මිණුම් දණ්ඩ කුමන සමාජයක, කුමන ප්‍රදේශයක වුවත් ඒකවිධ ස්වභාවයක් ගැනීම තුළින් එය සාපේක්ෂ දිළිඳුකමෙන් වෙනස් වේ.

ආබාධිත, වයස්ගත සහ මන්දබුද්ධික ආදී වශයෙන් වූ පුද්ගලයින්ට දිළිඳුකමෙන් ඉවත්වීමට අවශ්‍ය ඉඩ පහසුකම්, අවස්ථා සලසා දුන්න ද ඔවුන්ට ඉන් ඉවත්වීමට අවශ්‍ය ශක්තිය නොමැත. මෙම තත්ත්වය නිධන්ගත දුප්පත්කම ලෙසින් සැලකේ. ශ්‍රී ලංකාව නිදහස ලැබූ දින පටන් ම සුබසාධන සේවාවන් සඳහා වැඩි අවධානයක් යොමුකර ඇතත් නිධන්ගත දුප්පතුන් කෙරෙහි එතරම් වැදගත් අන්දමේ අවධානයක් යොමුකර නොමැති බව පෙනේ.

දුප්පත්කම කුමන ආකාරයකට විග්‍රහ කළත්, ලොව පුරා රටවල් එකී දුප්පත්කමෙන් මිදීමට විවිධාකාර වූ ප්‍රයත්නයන් දරා ඇතත්, සිදුව ඇත්තේ දුප්පත්කම තව තවත් වර්ධනය වීමකි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වුවද, මෙය අසත්‍යයක් නොවේ. 1992 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කෘෂිකර්මය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් ඉදිරිපත් කරන ලද වාර්තාවකට අනුව ගත වූ අවුරුදු 20 තුළ ලොව පුරා දුප්පත්කම 40%කින් වැඩි වී ඇත. මෙම කාලයේදී, දුප්පතුන්ගේ දුප්පත්කම වඩ වඩාත් වේගයෙන් වර්ධනය වන රටවල් අතුරින් ප්‍රමුඛස්ථානයක ශ්‍රී ලංකාව ද පවතින බව සඳහන් විය. ශ්‍රී ලංකාව මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහොමයක් මෙම බැරෑරුම් ප්‍රශ්නයට මුහුණ දෙමින් සිටින අතර මෙම රටවල ආර්ථික සංවර්ධනයට වඩා වැඩි වේගයකින් දුප්පත්කම වර්ධනය වන බව නොරහසකි.

මේ අන්දමට වර්ධනය වන දුප්පත්කම හඳුනාගැනීමේ නිර්ණායක රටින් රටට, කාලයෙන් කාලයට මෙන්ම විවිධ වැඩසටහන් අනුව ද වෙනස් වේ. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ දුප්පත්කම අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වූ ජනසවිය සහ තවමත් ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන පෙන්වා දිය හැකිය. ජනසවිය වැඩසටහනේ දී පවුලේ මාසික ආදායම රුපියල් 700/- ට අඩු පිරිස් දුප්පතුන්

ලෙස සැලකූ අතර සමෘද්ධි වැඩසටහනේ දී එය රු.1000/- ලෙස සලකන ලදී. එමෙන්ම, ජනසවිය භාරකාර අරමුදල යටතේ ප්‍රතිලාභීන් ලෙස තෝරා ගැනුනේ පවුලේ මාසික ආදායම රු.1500/- ට අඩු පිරිස් ය. මේ අනුව පැහැදිලි වන්නේ, දුප්පත්කම මැනීම පිළිබඳ නිර්ණායක රටින් රටට මෙන් ම කාලානුරූපව ද වෙනස්වන බවයි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද 2006/2007 ගෘහ ආදායම් /වියදම් සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගේ ප්‍රතිශතය 15.2% කි. 1990/91 වර්ෂය සමඟ සැසඳීමේදී මෙයින් ශ්‍රී ලංකාවේ දුප්පතුන් අඩුවීම පිළිබඳ අදහසක් ඉදිරිපත් කරනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගේ ව්‍යාප්තිය පිළිබඳ සලකා බැලුවහොත් පැහැදිලි වන්නේ ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ දුප්පතුන් විශාල ප්‍රමාණයක් ගොනු වී ඇති බවයි. ඒ බව පහත සඳහන් වගුව මගින් පැහැදිලි වනු ඇත.

**ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගේ ව්‍යාප්තිය**

| අංශය | 1990/91 | 1995/96 | 2006/07 |
|---|---|---|---|
| නාගරික | 18.2% | 13.4% | 6.7% |
| ග්‍රාමීය | 34.7% | 28.7% | 15.7% |
| වතු | 20.5 | 26.1% | 32.0% |
| ශ්‍රී ලංකාව | 30.4% | 26.7% | 15.2% |

මෙම සංඛ්‍යා සටහන අනුව ග්‍රාමීය සහ නාගරික අංශයන්හි දුප්පත්කම අඩු වී ඇතත් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන වතු ක්ෂේත්‍රය තුළ දුප්පත්කම වර්ධනය වී ඇති බව පෙනේ. මෙම ක්ෂේත්‍රය තුළ ආර්ථික දුප්පත්කම මෙන්ම නිවාස, ආහාර, මූලික සෞඛ්‍ය පහසුකම් ආදී අංශ ගණනාවක දුප්පත්කම මුල් බැස ගෙන ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග සසඳා බැලීමේ දී ශ්‍රී ලංකාවේ දුප්පත්කම විශේෂත්වයක් ගනු ලබයි. එනම්, මානව සංවර්ධනය අතින් සංවර්ධිත රටවල මට්ටමට ආසන්නව පවතින ශ්‍රී ලංකාව ආර්ථික සංවර්ධනය අතින් ඉතාම පහළ මට්ටමකත්, ණයගැති භාවයෙන් ඉතාම ඉහළ මට්ටමකත් පැවතීමයි. එසේ වුවත්, ශ්‍රී ලංකාව තුළ වුවද, වැවිලි ක්ෂේත්‍රය තුළ මෙම චිත්‍රය ඒ ආකාරයටම නිරූපණය නොවේ. ආර්ථික මට්ටමෙන් මෙන්ම මානව සංවර්ධනය අතින් ද වැවිලි ක්ෂේත්‍රයේ ජනතාව දිළිඳු මට්ටමක රැඳී සිටින මට්ටමක පවතින බව සත්‍යයකි.

දිළිඳුකම පිළිබඳව සාකච්ඡා කිරීමේදී එයට සමාන්තරව භාවිතාවන වදනක් ලෙසින් ආදායම, ආදායම් බෙදී යාම පිළිබඳ තත්ත්වය සැලකිල්ලට භාජනය වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 50% ක් මාසික ආදායම ලෙස ලබන්නේ රු.4,105/- හෝ ඊට අඩු ආදායමක් වන අතර මාසිකව රු.8,145 ට වැඩි ආදායමක් ලබන්නේ ජනගහනයෙන් 20%ක් පමණි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ අඩුම ආදායම් ලබන 10% භුක්ති විඳිනු ලබන්නේ ජාතික ආදායමෙන් 1.8% කි. වැඩිම ආදායම ලබන 10% ජාතික ආදායමෙන් 39.8% ක් භුක්ති විඳිනු ලබයි. ආදායම් ව්‍යාප්ති විෂමතාව ඉතා ඉහළ මට්ටමකින් ශ්‍රී ලංකාව තුළ පවතින බව මේ තුළින් හෙළිකරන සත්‍යයයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් නිකුත් කල වාර්තාවකින් හෙළිවන්නේ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 18% වැඩි ප්‍රමාණයක් අන්ත දිළිඳුකමෙන් පෙළෙන බවයි. ශ්‍රී ලංකාවේ දිළින්දන් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම තුළින් පෙන්නුම් කරන්නේ සමාජ සුභ සාධනය සඳහා සිදු කෙරෙන රාජ්‍ය වැය බර ප්‍රමාණය ද ඉහළ යන බවයි. නිදහස් ශ්‍රී ලංකාවේ සමාරම්භක අවධියේ පටන් ම සුභසාධන ප්‍රතිපත්තීන් පිළිබඳ වැඩි අවධානයක් යොමු වූ අතර එදා මෙදා තුර බලයට පත් වූ සෑම ආණ්ඩුවක්ම අඩු වැඩි වශයෙන් සුභසාධන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කර ඇත. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 16% පමණ සමාජ සුභසාධනයට වැය කිරීමෙන් එය මනාව පැහැදිලි වේ. මෙම සමාජ සුභසාධන ප්‍රතිපත්තීන්වල ද වැඩි අවධානයක් මිනිස් අවශ්‍යතාවන් වන ආහාර සඳහා ලබා දී ඇත. 1979 වසර වනතුරු ආදායම් බදු නොගෙවන සෑම කෙනෙකුටම සතියකට සහල් සේරුවක් නොමිළයේත්, සේරු තුනක් සහන මිළකටත් ලබාදුන් අතර මේ සඳහා රාජ්‍ය වියදම්වලින් විශාල ප්‍රමාණයක් වැය කිරීමට සිදුවිය. මෙය අවසාන වශයෙන් රාජ්‍යයට වැය බරක් වුවත් සංවර්ධනය මෙන්ම මූලික මානව අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් සිදුකල එම වැය බර අගය කළයුත්තක් වේ. මන්ද යත්, ඒ තුළින් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක මන්ද පෝෂණයෙන්, කුසගින්නෙන් පෙළෙන ජනතාවක් ඉන් යම්තාක් දුරට හෝ මුදවා ගනිමින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය මෙන්ම කුසගින්නෙන් මියයාම වළක්වා ලීමට දැරූ උත්සාහයක් වන බැවිනි.

ශ්‍රී ලංකාවේ ආහාර සහනාධාර ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී, එය දෙවන ලෝක යුද්ධ සමය දක්වා ඉතිහාසයකට නෑකම් කියන බව පැහැදිලිය. දෙවන ලෝක යුද්ධයට පෙර ඇති වූ ආහාර හිඟයට පිළියමක් ලෙසින් ශ්‍රී ලංකාව තුළ ආහාර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කළ අතර නිදහසින් පසුව ද බලයට පත් රජයන් විසින් එය විවිධාකාර සංශෝධනයන්ට ලක් කරමින් මේ වන තෙක්ම ක්‍රියාත්මක කරමින් පවතී. 1942 දී පිහිට වූ ආහාර සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ආහාර ද්‍රව්‍ය මිලට ගෙන ජනතාවට සැපයූ අතර 1970 දශකයේදී පොදුවේ සමස්ත ජනතාවටම සහනාධාර ක්‍රමයට ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ පිළිවෙත වෙනස්කර ආදායම් මට්ටම සැලකිල්ලට ගනිමින් ආහාර සහනාධාර ලබාදීම සිදුවිය. මෙහි දී, ආදායම් බදු නොගෙවන්නන්ට පමණක් නොමිලයේ සහල් සේරුව බැගින් ලබාදුන් අතර 1978 සිට ආහාර සලාකය ආදායම් මට්ටමින් ඉතාම පහළ අයට පමණක් ලබාදීමට පියවර ගැණුනි. එසේ වුවත්, ජනගහනයෙන් 50% පමණ ප්‍රමාණයක් මේ ක්‍රමයට ඇතුලත් විය. 1979 දී ආහාර මුද්දර ක්‍රමය හඳුන්වා දුන් අතර 1989 දී දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහනක් වශයෙන් ජනසවිය ද, 1994 දී සමෘද්ධි වැඩසටහන ද, හඳුන්වා දෙන ලදී. මෙතෙක් ආහාර සහනාධාරය පමණක් ඉලක්ක කරගත් සහනාධාර වැඩ පිළිවෙල 1989 සිට දිළිඳුකමේ විෂම චක්‍රය බිඳ හෙළීමේ අරමුණ සහිතව දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් ලෙස ඉදිරිපත් විය. මෙම වැඩසටහන් ඔස්සේ වුව ද, ආහාර සහනාධාර සඳහා රජය විසින් සිදුකරන වැය අඩු වී නොමැති බව පෙනේ. මෙය තවදුරටත් රාජ්‍යයට වැයබරක් වෙමින් පවතින අතර මෙම තත්ත්වයෙන් මිදීමට ජනතාව දිරිගැන්වීම, ඔවුන් සවිබල ගැන්වීම සමෘද්ධි වැඩසටහන ඔස්සේ සිදු කිරීම අපේක්ෂාව වී ඇත. එනමුත් පවතින සමාජ, ආර්ථික වටපිටාව තුළ එම අරමුණ නියි පරිදි ඉටුකර ගැනීමට හැකිවේද යන්න ගැටළුවක්ව පවතී.

ඇතැම් විද්වතුන් පෙන්වා දෙන අන්දමට දරිද්‍රතාව පිළිබඳ මූලික සත්‍ය නම් එය මූලික ප්‍රශ්නයක් නොවීමයි. එයට නියම හේතුව මනුෂ්‍ය වර්ගයා පොහොසත් ද, දුප්පත් ද කොටස්වලට ජාතීන් තුළත්, ජාතීන් අතරත් බෙදී තිබීමයි. ප්‍රශ්නයේ බරපතලකම මතුවන්නේ පොහොසතාට දුප්පතා කෙරෙහි බලපෑමක් ඇතිකළ හැකිවීම තුළිනි. එසේම, පොහොසත් ජාතියට පොහොසත් නොවන ජාතියේ ප්‍රතිපත්ති කෙරෙහි බලපෑ හැකි වේ. ගෝලීයකරණය පිළිබඳ සාකච්ඡා කෙරෙන මෙම අවධියේ ඉහත සඳහන් වූ අදහස තුළින් පිළිබිඹු කරන එක් වැදගත් සත්‍යක් පවතී. එනම්, කුමන හෝ මාර්ගයක් ඔස්සේ පොහොසත් ජාතියට, පොහොසත් නොවන ජාතියේ ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් කිරීමට හැකියාවක් පවතින බවයි. සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන් පමණක් නොව සංස්කෘතිය පවා ගෝලීයකරණය වී ඇති යුගයක ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් තව තවත් ණය ආගාධයෙහි ගිල්ලවීමට මෙම තත්ත්වය දායක වී ඇත.

දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් කෙතරම් ක්‍රියාත්මක වුවත් රටේ පවතින දුප්පත්කම තවදුරටත් වර්ධනය වීමට හේතුව කුමක්ද? යන්න විමසා බැලීම මෙහි දී වැදගත් වේ. එක් අතකින් සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත සංවර්ධිත රටවලට කළ හැකි බලපෑමත්, විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් ඉදිරියේ පවතින එක්තරා මට්ටමක බාධාවක් ලෙස හඳුනා ගැනීමට හැකි වේ. දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් යටතේ කුඩා පරිමාණ කර්මාන්ත, ව්‍යාපාර, ස්වයං රැකියා ආදිය ආරම්භ කර පවත්වාගෙන යනු ලැබුවත්, බොහෝවිට ඒවා තුළින් අපේක්ෂිත මට්ටමේ ප්‍රතිඵල නොලැබෙන බව සත්‍යයකි. මෙහිදී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පවතින තරගකාරීත්වයට සුළු කර්මාන්ත සහ ස්වයංරැකියාවල නියුක්තව නිෂ්පාදන කටයුතුවල යෙදෙන්නන්ට මුහුණදීමට පවතින නොහැකියාව නිසා බොහෝ විට එම කර්මාන්ත බිඳ වැටේ. එවැනි අවස්ථාවල දී සිදුවන්නේ එම පුද්ගලයා තවදුරටත් ණයකරුවෙකු බවට පත්ව අන්ත අසරණ තත්ත්වයට පත්වීමයි. සමස්තයක් ලෙස ගෝලීයකරණය අයහපත්, දුර්විපාක ගෙන දෙන ක්‍රියාදාමයක් නොවුවත් සංවර්ධනය වෙමින් පවතින රටවල බොහෝ අංශ කෙරෙහි එය කිසියම් අහිතකර බලපෑමක් සිදුකරන බව පෙනේ.

හිසරදයට පාවිච්චි කරන වේදනා නාශක ඖෂධයේ පටන් කෙනෙකුගේ දින චර්යාව පිළිබඳව විමසිලිමත්වීමේ දී රාත්‍රියේ නින්දට යනවිට පාවිච්චි කරන මදුරු දඟරය දක්වා පෙන්නුම් කරන්නේ ගෝලීයකරණ ක්‍රියාදාමයයි. එයට අප අනුගත වී

ඇති ආකාරයයි. මෙවැනි ක්‍රියාදාමයක් තුළ දුප්පතකම තුරන් කිරීමේ වැඩසටහන් ඔස්සේ සුළු කර්මාන්ත සහ ස්වයං රැකියා දිරි ගැන්වුව ද බොහෝවිට ඒවායේ නිෂ්පාදන වියදම් වැඩිවීම, ගුණාත්මක තත්ත්වය පිළිබඳ පවතින යම් යම් ගැටළු ප්‍රචාරණයේ අපහසුතා ආදිය නිසා විවෘත වෙළඳපොළේ තරඟකිරීමේ හැකියාව ඉතාම අල්ප වන අතර ඉතා ඉක්මනින් එම කර්මාන්ත සහ නිෂ්පාදන බිඳ වැටීමේ අවධානමක් පවතී.

මෙවැනි තත්ත්වයක් තුළ දේශීය සුළු කර්මාන්ත සහ නිෂ්පාදන ආරක්ෂා කර ගනිමින් දුප්පත්කම තුරන් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නේ නම් එම කර්මාන්තකරුවන් සහ නිෂ්පාදකයින් කිසියම් ආකාරයකට සංවිධානය කොට ඔවුන්ගේ නිපැයුම් සඳහා අවශ්‍ය ප්‍රචාරණය ලබාදීම, වෙළඳපොල සකසා ගැනීමට උපකාර කිරීම මෙන් ම මනා පසු විපරමක් පැවතීම ද අවශ්‍ය වේ. එසේ නොවුහොත් දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් ඔස්සේ ශ්‍රී ලංකාවේ දුප්පතුන් තවදුරටත් දුප්පතුන්වීම වැලැක්විය නොහැකිවනු ඇත.


**එම්.කේ.එන්. දමයන්ති**

*පර්යේෂණ නිලධාරිණී*

**කෘෂි ප්‍රතිපත්ති සහ ඇගයීම් අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය